**ශීර්ෂය 284 - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් අත්පත් කරගෙන තිබුණු රු.308,032,299 ක භෞතික වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | වර්ෂයේ මිලදී ගැනීම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවට අදාළ ස්ථාවර වත්කම් ශේෂයන් **Cigas** මෘදුකාංගයේ ස්ථාවර වත්කම් ශේෂයන් නොසැසඳින. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් ලැබීම් රු.496,665,961 ක් දක්වා තිබුණ ද විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු.77,270,068 ක් විය. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර සාරාංශ සමඟ මාසිකව සැසඳීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) භාණ්ඩාගාර ප්‍රේෂණ රු.471,472ක් හා ආදායම් ගෙවීම් රු.237,802,027 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | -එම- | ආදායමෙන් ගෙවීම හා භාණ්ඩාගාර ප්‍රේෂණ ඇතුළත් කර ඇති බැවින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව භාණ්ඩාගාර අග්‍රිම රු.542,624,000 ක් වුවද මාසික ගිණුම් සාරාංශ අනුව එය රු.552,759,418 ක් විය. | -එම- | 2017 වර්ෂයට අයත් 2018 වර්ෂයේ කරන ලද අයිතමවලට අදාළ වේ. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.3,859,830,467 ක් වුවද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එය රු.3,935,862,072 ක් විය. | දෙපාර්තමේන්තු පොත් හා ගිණුම් සාරාංශ, භාණ්ඩාගාර පොත් හා මාසිකව සැසඳීමට කටයුතු කළ යුතුය. | සත්‍ය වශයෙන් මුදල් ලැබීම්වල එකතුව සැලකිල්ලට ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකළ මුදල රු.2,772,770,802 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කර තිබුණ ද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එය රු.3,607,198,585 ක් විය. | -එම- | විස්තරාත්මක ගැලපීම් සිදුකර ඇත. වෙනස්වීම් ගලපා මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කරමි. |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් නොමැති බව දක්වා තිබුණ ද මාසික ගිණුම් සාරාංශ හා අනෙකුත් තොරතුරු අනුව අත්තිකාරම් ආපසු අයකර ගැනීම් රු.55,792,855 ක් විය. | -එම- | -එම- |
| (ඇ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය රු.17,167,390 ක් ලෙස දක්වා තිබුණ ද මාසික ගිණුම් සාරාංශ හා අනිකුත් තොරතුරු අනුව එය රු.384,581,760ක් විය. | -එම- | -එම- |
| (ඉ) | තැන්පත් ගිණුම් හා අනිකුත් වගකීම්වල වෙනස්වීම් රු.1,069,892,276 ක් ලෙස දක්වා තිබුණ ද මූල්‍ය ක්‍රියාකාරකම්වලින් එවැනි කිසිදු මුදලක් ජනිත වී නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | ආරම්භක මුදල් ශේෂයක් හා අවසාන මුදල් ශේෂයක් නොමැති බව දක්වා තිබුණද 2018 ජනවාරි 01 දිනට රු.135,418 ක අග්‍රිම ශේෂයක් පැවතිණි. | -එම- | -එම- |

**1.6.4. තැන්පතු**

---------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉදිකිරීම් කොන්ත්‍රාත්වලින් රඳවා ගෙන තිබුණු රු.107,352,613 ක් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අඩුපාඩු ඇති ඉදිකිරීම්වලින් අයකරගත යුතුව ඇත. |

**1.6.5. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති | 3,702,788 | මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 60 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 396(ඈ) | 412,656 | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ චෙක්පත් 59 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතුය. | රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571(3) | 745,419 | හිමිකම් නොපෑ වැටුප් හා ප්‍රසාද දීමනා පියවා නොතිබුණු අවස්ථා 40 ක් හා ව්‍යාපෘතිය නිමවී වර්ෂ 02 ක් තුළ පියවා නොතිබුණු අවස්ථා 94 ක් නිරීක්ෂණය විය. | -එම-. | -එම-. |
| (ආ) | 2016 දෙසැම්බර් 26 දිනැති හා අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | දෙපාර්තමේන්තුවට අයත් වාහන 22 ක ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතුවිය. | 2019 ජූනි සිට කිරීමට සැලසුම් කර ඇත. |

**1.6.6. අවිධිමත් ගනුදෙනු**

--------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරික්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| විධිමත් අධිකාරී බලයකින් තොරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ යෝජිත අලි කළමනාකරණ රක්ෂිතය තුළ පස් කැපීම සඳහා නිර්දේශ කිරීම නිසා අක්කර 18 ක භූමි ප්‍රදේශයක් මීටර් 15 ක් පමණ ගැඹුරට කැනීම් කර තිබුණු අතර ඒ හේතුවෙන් වන සතුන්ගේ ජීවිත අනාරක්ෂිත කර තිබුණි. | වනසතුන්ගේ පැවැත්මට හානි විය හැකි අවස්ථා අවම වන කොන්දේසි පැනවීම හා නියාමනය කළ යුතුවීම. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

**1.6.7. වංචනික ස්වරූපයේ ගනුදෙනු**

------------------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වර්ෂ දෙකක් තුළ සේනානායක සමුද්‍රයේ බෝට්ටු ධාවනය සඳහා වැඩිපුර භූමිතෙල් ඉන්ධන ලීටර් | සෑම මාස 06 කට වරක් මාණ්ඩලික නිලධාරියෙකු ඉදිරියේ ධාවනය සිදුකර | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

| | |
|---|---|
| 15,690 ක් භාවිත කර තිබූ අතර එහි වටිනාකම රු.1,035,540 ක් විය. | ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කිරීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 84 දක්වා පරාසයක විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තුව පිළියෙල කළ යුතුවීම. | අවශ්‍ය අනුමැතිය ලබාදී නොතිබීම හේතුවෙන් ප්‍රතිපාදනද ඉතිරි විය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් රු.72,250,000 ක් වූ කාර්යභාරයන් 29 ක් ඉටුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත. |

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 වගන්තියට පටහැනිව ඒකකයක මිල ඉහළ අගයක් දක්වන සහ වහාම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1(ආ) **(iii)** හා ප්‍රසම්පාදන කාර්ය |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගත නොහැකි භාණ්ඩ සඳහා වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය (Shopping) අනුගමනය කර තිබුණු අවස්ථා 03 ක් විය. | අනුකූලව කටයුතු කළ යුතුවීම. | සංග්‍රහය සඳහා වූ අතිරේක 28 ට අනුකූලව වෙළඳපළ මිල සැදහුම් ක්‍රමය යොදාගෙන ඇත. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 හා 4.3.2 වගන්ති ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කරගෙන නොතිබුණු අවස්ථා 03 ක් විය. | -එම- | වර්තමානයේදී පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කරනු ලැබේ. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.2, 7.9.2 හා 7.9.3 වගන්ති ප්‍රකාරව අසාමාන්‍ය විචලනයන් අනාවරණය කර ගැනීම සඳහා ඉංජිනේරුවරයාගේ ඇස්තමේන්තුව සමාලෝචනය කර නොතිබුණු අවස්ථා 04 ක් විය. | -එම- | ඉංජිනේරු ඇස්තමේන්තුව සමාලෝචනය කර නැත. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 වගන්තිය අනුව අවස්ථා 02 කදී කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | -එම- | වර්තමානයේදී කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.13 හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කරන ලද ICTAD/SDB/01 ප්‍රකාශනයේ 49 වගන්තිය පරිදි අවස්ථා 03 දී රු.1,029,789 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ප්‍රමාද ගාස්තු අයකර ගත යුතුවීම. | ගැටළු හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වූ බැවින් දින දීර්ඝ කිරීම ලබාදී ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | ------------------------ |
| (අ) | කිරිගල්ඹෙ කැස්බෑ සංරක්ෂණ සංචාරක මධ්‍යස්ථානය හා ඊට යාබද මධ්‍යස්ථානය පුළුල් කිරීම සඳහා රු.3,379,729 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිලි 02ක් නිෂ්කාර්යව හා ඌණ | සංචාරක මධ්‍යස්ථානයට අවශ්‍ය නිලධාරීන් යෙදවිය යුතුවීම. | අප්‍රේල් සිට නොවැම්බර් දක්වා කාලයේදී වසා තැබීමට තීරණයක් ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | උපයෝජිතව පැවතුණි. | | |
| (ආ) | රිටිගල ඇත්අතුරු සෙවණ භාවිතයෙන් තොරව ඌණ උපයෝජිතව පැවතීම. | භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරවි දූපත ජාතික උද්‍යානය නැරඹීමට යන සංචාරක බෝට්ටු ලියාපදිංචි කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග හඳුන්වා දී නොතිබුණි. | සංචාරක කටයුතු නියාමනය කළ යුතුවීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | හික්කඩුව ජාතික උද්‍යානයේ ප්‍රවේශ ගාස්තු සංශෝධනය කර නොතිබුණි. | -එම- | ගාස්තු සංශෝධනය කිරීම පිණිස රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ වූ අලි මරණ 319 කින් දුම්රියේ ගැටී අනතුරට පත්ව 16 ක් හා විදුලිය වැදීම් හා වෙනත් අනතුරුවලින් 70 ක් මිය ගොස් තිබුණද එම තත්ත්වය වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වන අලි මියයාම පාලනයට නිවැරදි ක්‍රියාමාර්ග ගතයුතු වීම. | දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ඇත. |
| (ඈ) | දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ මිල කැඳවීමකින් තොරව ගොඩනැගිලි 14 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණද කුලී ගිවිසුම් 2019 ජූලි මස වනතෙක් යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසිද්ධ මිල කැඳවීම් සිදුකර කටයුතු කිරීම හා කුලී ගිවිසුම්වලට එළඹිය යුතුවීම. | අදහස් දක්වා නැත. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන තිබුණද ඒවා ළඟා කර ගැනීමට හැකිවන අයුරින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | අරමුණු හා ඉලක්කයන් හඳුනා ගැනීම හා ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළයුතු වීම. | මේ සඳහා පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |
| (ආ) | උඩවලව ජාතික උද්‍යානය ඇතුලු උද්‍යානවල ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ස්ථිර වැඩපිළිවෙලක් හඳුනාගෙන නොතිබුණු අතර, වනසත්ව අවශ්‍යතාවයට ප්‍රමාණවත් ශාක වඳවීයාමේ තර්ජනයක් වී තිබුණි. | ආක්‍රමණික ශාක ඉවත් කිරීමට ස්ථිර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. | -එම- |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගල්ඔය නිම්න ජාතික උද්‍යානයේ, නාමල් ඔය බීට්වු කාර්යාලයේ දුරකථනය සක්‍රිය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් වන අලි ගම්වැදීම දැනුම් දීමේ ක්‍රියාවලිය අඩපණ වී තිබුණු අතර, ඉන් අලි මිනිස් ගැටුම අවම කිරීමේ ක්‍රියාවලියට බලපෑමක් සිදු වී තිබුණි. | දුරකථන පහසුකම් නිසි පරිදි නඩත්තු කළයුතු වීම. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

## 6. මානව සම්පත් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 31 ඇතුළුව දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 594 ක් පැවති බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. | මේ සඳහා පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. |